# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2134/2 – 2019 ජූලි 29 වැනි සඳුදා – 2019.07.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 675, කොටිකාපොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොටිකාපොල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේයූ/එම්ඩබ්ලිව්ටී/2016/576 හා 2018.06.21 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – පිටියකන්දවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0847ක් පමණ

උතුරට: සී/ස බොගවන්තලාව වැවිලි (පුද්ගලික) සමාගම (ලලාන් රබර් වැවිලි (පුද්ගලික) සමාගම) හිමිකම් කියන පිටියකන්දවත්ත සහ වාරිමාර්ග ඇළ; නැගෙනහිරට: වාරිමාර්ග ඇළ සහ කොස්පොතු ඔය; දකුණට: එම්. ඩබ්ලිව්. එල්. පී. කුමාර හිමිකම් කියන අමුණවත්ත; බටහිරට: සී/ස බොගවන්තලාව වැවිලි (පුද්ගලික) සමාගම (ලලාන් රබර් වැවිලි (පුද්ගලික) සමාගම) හිමිකම් කියන පිටියකන්දවත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2014/ඩබ්ලිව්එස්/15.
2019 මැයි මස 09 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 491

1A – G 30612 – 21 (2019/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*